# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2023.07.31 |

## කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය, මාස දහනවයකට පසුව 2023 ජූලි මාසයේ දී නැවතත් තනි අගයක මට්ටමට ළඟා විය.

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2021=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2023 ජූනි මාසයේ වාර්තා වූ සියයට 12.0හි සිට 2023 ජූලි මාසයේ දී සියයට 6.3 දක්වා පහළ ගියේය. මතුපිට උද්ධමනයේ මෙම පහළ යෑම, 2023 ජූලි මාසයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපේක්ෂා කරන ලද උද්ධමනය පහළ යෑමේ ප්‍රවණතාවට බොහෝ දුරට අනුකූල වේ.

| උද්ධමනය කො.පා.මි.ද., (2021=100) | 2023 ජූනි | 2023 ජූලි |
|---|---|---|
| දර්ශක අගය | 192.3 | 190.2 |
| මාසික වෙනස (%) | 0.0 | -1.1 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 12.0 | 6.3 |

ආහාර කාණ්ඩය, වසර හතරකට ආසන්න කාලයකට පසුව, 2023 ජූනි මාසයේ පෙන්නුම් කළ සියයට 4.1ක වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයට සාපේක්ෂව 2023 ජූලි මාසයේ දී සියයට 1.4ක අවධමනයක් වාර්තා කළේය. මේ අතර, ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2023 ජූනි මාසයේ පැවති සියයට 16.2හි සිට 2023 ජූලි මාසයේ දී සියයට 10.5 දක්වා තවදුරටත් පහළ ගියේය. ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල දක්නට ලැබුණු සියයට -1.13ක මිල පහළ යෑමේ සහ ආහාර කාණ්ඩයේ අයිතමවල වාර්තා වූ සියයට 0.01ක සුළු මිල ඉහළ යෑමේ ඒකාබද්ධ බලපෑම හේතුවෙන් 2023 ජූලි මාසයේ දී කො.පා.මි. දර්ශකයේ මාසික වෙනස සියයට -1.12ක් ලෙස වාර්තා විය. තවද, ආර්ථිකයේ යටිදැරි උද්ධමනය පිළිබිඹු කරන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය, 2023 ජූනි මාසයේ පැවති සියයට 9.8හි සිට 2023 ජූලි මාසයේ දී සියයට 6.1 දක්වා පහළ ගියේය.

**කො.පා.මි.ද. (2021=100) මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය**




දැනට පවතින තොරතුරු අනුව, උද්ධමනය තවදුරටත් පහළ ගොස් මැදි කාලීනව ඉලක්කගත මට්ටම වටා ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙලෙස උද්ධමනය පහළ යෑම කෙරෙහි දැඩි මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල පසු බලපෑම, සැපයුම් අංශයේ වර්ධනයන්, බලශක්ති හා ආහාර උද්ධමනය පහළ යෑම සහ හිතකර සංඛ්‍යානමය පදනම් බලපෑම ද සහාය වේ.

**මතුපිට උද්ධමනයේ පුරෝකථන(අ)**
**කොළඹ පාරිභෝගික මිල දර්ශකය,(ආ) කාර්තුමය, වාර්ෂික ලක්ෂ්‍යමය, %**




උද්ධමන ව්‍යාප්ති සටහන (Fan chart) මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්වාසනීය පරාස භාවිත කිරීමෙන් විදහා දක්වේ. පවත්නා දේශීය හා ගෝලීය ආර්ථික අවිනිශ්චිතතා සහ භූ-දේශපාලනික අර්බුද මධ්‍යයේ වත්මන් පුරෝකථන හා සම්බන්ධ අවිනිශ්චිත බව සාමාන්‍ය කාලයන්ට වඩා ඉහළ වේ. විශේෂයෙන්ම, සැපයුම් තත්ත්වයන් ශීඝ්‍රයෙන් යථා තත්ත්වයට පත් වීම, අපේක්ෂිත මට්ටමට වඩා වැඩි වශයෙන් ගෝලීය වෙළඳ භාණ්ඩ මිල පහළ යෑමේ හැකියාව සහ ඒවා දේශීය මිල ගණන් වෙත සම්ප්‍රේෂණය වීම යනාදී කරුණු හේතුවෙන් අපේක්ෂිත උද්ධමනය පහළ යෑමේ අවිනිශ්චිතතා ඇති විය හැකිය. කෙසේ වෙතත්, අපේක්ෂිත ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීමත් සමඟ ඇතිවිය හැකි ඉල්ලුම් පීඩන සහ ආනයන සීමා හා ප්‍රාග්ධන ප්‍රවාහ සම්බන්ධ ක්‍රියාමාර්ග ලිහිල් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස විනිමය අනුපාතිකය යම්කිසි අවප්‍රමාණය වීමක් සිදු වුවහොත් අපේක්ෂිත පුරෝකථනයන්ට වඩා උද්ධමනය ඉහළ යෑමේ අවිනිශ්චිතතා ඇති විය හැකිය.

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන*

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් දළ දේශීය නිෂ්පාදිතයේ ඇස්තමේන්තු නිකුත් කිරීමත් සමගම මහ බැංකුව එහි මැදි කාලීන ආර්ථික පුරෝකථන කාර්තුමය පදනමින් සංශෝධනය කරයි. මෙහි පෙන්වා දී ඇති උද්ධමන ව්‍යාප්ති සටහන මගින් දක්වා ඇති පුරෝකථන මගින් පවතින දත්ත සහ 2023 වසරේ ජූලි මාසයේ පුරෝකථන වාරයේ දී සිදු කරන ලද උපකල්පන හා විනිශ්චයන් පිළිබිඹු කෙරේ.

(ආ) 2022 වසරේ සිව්වන කාර්තුව දක්වා වූ දත්ත කො.පා.මි.ද. (2013=100) මත පදනම් වන අතර ඉන් පසුව වාර්තා කරන ලද දත්ත කො.පා.මි.ද. (2021=100) මත පදනම් වේ. එම සියලුම ප්‍රකාශිත දත්ත මත පුරෝකථන පදනම් වේ.

[1] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අතර එමගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල කුටුම්බ විසින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල මිලෙහි සාමාන්‍ය වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

**උප කාණ්ඩ අනුව කො.පා.මි.ද. (2021=100) මත පදනම් වූ මතුපිට උද්ධමනය**
**(වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)**




## කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2021=100) හැසිරීම

| කාලපරිච්ඡේදය | | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2022 | අගෝස්තු | 182.8 | 163.6 | 2.2 | 1.7 | - | - |
| | සැප්තැම්බර් | 189.3 | 168.8 | 3.6 | 3.2 | - | - |
| | ඔක්තෝබර් | 188.5 | 170.4 | -0.4 | 0.9 | - | - |
| | නොවැම්බර් | 187.1 | 171.1 | -0.7 | 0.4 | - | - |
| | දෙසැම්බර් | 187.6 | 171.5 | 0.3 | 0.2 | - | - |
| 2023 | ජනවාරි | 188.6 | 172.4 | 0.5 | 0.5 | 51.7 | 45.6 |
| | පෙබරවාරි | 189.5 | 172.3 | 0.5 | -0.1 | 50.6 | 43.6 |
| | මාර්තු | 195.0 | 171.9 | 2.9 | -0.2 | 50.3 | 39.1 |
| | අප්‍රේල් | 192.3 | 171.5 | -1.4 | -0.2 | 35.3 | 27.8 |
| | මැයි | 192.3 | 171.0 | 0.0 | -0.3 | 25.2 | 20.3 |
| | ජූනි | 192.3 | 169.9 | 0.0 | -0.6 | 12.0 | 9.8 |
| | ජූලි | 190.2 | 170.7 | -1.1 | 0.5 | 6.3 | 6.1 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව